# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# වයඹ පළාතේ පළාත් සභාව

---

## 1991 අංක 03 දරන
## පළාත් පාලන ආයතන
## (විශේෂ විධිවිධාන) ප්‍රඥප්තිය

---

(අනුමත කළ දිනය : 1991.03.18)

වයඹ පළාතේ පළාත් සභාවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1992 ජූනි මස 26 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
ගැසට් පත්‍රයේ IVඅ කොටසේ පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

වයඹ පළාත් සභාවේ සභා කාර්යාලයෙන් මිලදී ගත හැක.

මිළ : රු. 5.00 — තැපැල් ගාස්තුව : රු. 2.00

# 1991 අංක 03 දරන පළාත් පාලන ආයතන (විශේෂ විධිවිධාන) ප්‍රඥප්තිය

මෙම ප්‍රඥප්තියේ උපලේඛනයෙහි දැක්වෙන ප්‍රාදේශීය සභාවලට විශේෂ කොමසාරිස්වරුන් පත්කිරීම සඳහාත් ඊට සම්බන්ධ හා ආනුෂංගික වූ කාරණා සඳහාත් විධිවිධාන සැලැස්වීම පිණිස වූ ප්‍රඥප්තියකි. *දිගු නාමය*

ශ්‍රී ලංකා ජන රජයේ වයඹ පළාතේ පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ.

1\. මෙම ප්‍රඥප්තිය 1991 අංක 03 දරණ පළාත් පාලන ආයතන (විශේෂ විධිවිධාන) ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලබන අතර, වයඹ පළාතේ ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය ලැබුණ දිනයේ සිට එය ක්‍රියාත්මක වන්නේ ය. *කෙටිනාමය හා ක්‍රියාත්මක වන දිනය.*

2\. (1) වෙනත් කවර හෝ නීතියක ප්‍රතිවිරුද්ධ කුමක් සඳහන් වුවද උප ලේඛනයේ සඳහන් කර ඇති කවර හෝ ප්‍රාදේශීය සභාවක කටයුතු පරිපාලනය කිරීම පිණිස ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියෝගයක මාර්ගයෙන් අමාත්‍යවරයා විසින් විශේෂ කොමසාරිස්වරයකු පත් කළ හැකි ය. *විශේෂ කොමසාරිස් වරුන් පත් කිරීම.*

(2) (1) වන උප වගන්තියේ සඳහන් විශේෂ කොමසාරිස්වරයා විය යුත්තේ ප්‍රාදේශීය සභාවේ කාර්යාලය පිහිටි කොට්ඨාශයේ ප්‍රාදේශීය ලේකම්වරයා නැතහොත් සහකාර ප්‍රාදේශීය ලේකම් වරයා ය.

(3) (1) වන උප වගන්තියේ සඳහන් විශේෂ කොමසාරිස්වරයාගේ පත්වීම, නියෝගයේ අන්‍යාකාරයකින් සඳහන් වුවහොත් හැර, මෙම වගන්තියේ (1) වන උප වගන්තියේ සඳහන් ප්‍රාදේශීය සභා වෙනුවෙන් මැතිවරණයක් පැවැත්වෙන තුරු බලාත්මක විය යුතුය.

(4) මෙම වගන්තියේ (1) වන උප වගන්තිය යටතේ ප්‍රාදේශීය සභාවකට පත් කරන ලද විශේෂ කොමසාරිස්වරයකුගේ නිත්‍ය තනතුර වූ ප්‍රාදේශීය ලේකම් ධුරය නැතහොත් සහකාර ප්‍රාදේශීය ලේකම් ධුරය, ස්ථාන මාරු කරනු ලැබීමෙන් හෝ මිය යාමෙන් හෝ ඉල්ලා අස්වීමෙන් හෝ සේවයෙන් පහ කරනු ලැබීමෙන් හෝ පුරප්පාඩු වේ නම් යථායෝග්‍ය පරිදි, එකී ප්‍රාදේශීය ලේකම් ධුරයට නැතහොත් සහකාර ප්‍රාදේශීය ලේකම් ධුරයට පත්වූ අනුප්‍රාප්තිකයා එවැනි ප්‍රාදේශීය සභාවක කටයුතු පරිපාලනය කිරීම පිණිස විශේෂ කොමසාරිස්වරයා වශයෙන් අමාත්‍යවරයා විසින් පත් කළ හැකිය.

3\. මෙම ප්‍රඥප්තියේ විධිවිධාන හා වෙනත් නීතියක විධිවිධාන අතර යම් ගැටුමක් හෝ අනනුකූලතාවක් වේ නම් එකී නීතියේ විධිවිධාන අභිබවා මෙම ප්‍රඥප්තියේ විධිවිධාන බලාත්මක විය යුතුය. *වෙනත් නීතියක් සමඟ ගැටීම හෝ අනනුකූලතාව.*

4\. මෙම ප්‍රඥප්තියේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතුය. *අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු බව.*

88 003650 — 2,500 (92/09)